අධිකරණ අමාත්‍යාංශයේ සමීක්ෂණයකින් හෙළි වේ

# මහාධිකරණවල නඩුවලින් 1/3ක්ම ළමා අපචාර ගැනයි

(රංජිත් ආනන්ද ජයසිංහ)

**මෙරට මහාධිකරණවල දැනට පවරා තිබෙන නඩුවලින් තුනෙන් එකක් පමණ ළමා අපචාර සිද්ධීන්වලට සම්බන්ධ ඒවායැයි වාර්තාවේ. මෙම ආන්දෝලනාත්මක තත්ත්වය හෙළිදරව් වූයේ අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් මේ පිළිබඳව සිදුකරන ලද විශේෂ විමර්ශනයකදීය.**

මෙම විමර්ශනයේදී හෙළිදරව් වී තිබෙන තොරතුරු අනුව දිවයිනේ මහාධිකරණවල විභාග වෙමින් පවතින නඩු 15,000න් 5,000ක් පමණ ළමා අපචාර සිද්ධීන්වලට අදාළ ඒවාය.

ළමා අපචාර නඩුවලින් වැඩි හරියක්ම විභාග වෙමින් පවතින්නේ ඇඹිලිපිටිය මහාධිකරණයේය. එහි විභාගවන නඩුවලින් 51%ක්ම ළමා අපචාර නඩුය.

පොළොන්නරුව මහාධිකරණයේ නඩුවලින් 45%ක්ද, රත්නපුරය මහාධිකරණයේ විභාග වන නඩුවලින් 40%ක්ද, මහනුවර විභාග වන නඩුවලින් 38%ක්ද, අනුරාධපුරය මහාධිකරණයේ නඩුවලින් 33%ක්ද, බදුල්ල මහාධිකරණයේ නඩුවලින් 32%ක්ද, ගම්පහ මහාධිකරණයේ නඩුවලින් 32%ක්ද, කුරුණෑගල මහාධිකරණයේ නඩුවලින් 32%ක්ද, යාපනය මහාධිකරණයේ නඩුවලින් 29%ක්ද ළමා අපචාර සිද්ධීන්වලට අදාළ ඒවාය.

12 වැනි පිටුවට...

## මහාධිකරණවල නඩුවලින්...

... 1 වැනි පිටුවෙන්

මේ පිළිබඳව ඉරිදා ලංකාදීපය කළ විමසුමකට පිළිතුරු දුන් අගවිනිසුරු අශෝක ද සිල්වා මහතා පැවසුවේ මේ ගැන වහාම සමාජය දැනුම්වත් කළ යුතු අතර උපරිම දඬුවම් ක්‍රමයක් මගින් සමාජ ශෝධනයට පියවර ගත යුතු බවය. ගම්බද බොහෝ ගොවි පවුල්වල පාසල් නොයන දරුවන් අපචාරයට ලක්වන බව පෙනී ගොස් ඇතැයි අගවිනිසුරුවරයා කීය.

අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා සඳහන් කළේ මෙම ඛේද ජනක තත්ත්වය තුරන් කිරීම පිණිස සමාජය දැනුම්වත් කිරීමට අමාත්‍යාංශය මහත් කාර්ය සාධන බලකායක් පත්කොට කඩිනම් ක්‍රියාමාර්ගයක් ගන්නා බවය.

18 Oct 09 SLD p. 1 & 12